**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - 2017**

**-----------------------------------------------------------------**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 18 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය - කාර්යාංශය**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය**

කාර්යාංශයේ පරිපාලිත සමාගම වූ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය නොකරන ලද මතයක් ප්‍රකාශකරන ලදී.

**2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - කාර්යාංශය**

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

ප්‍රමිතයේ 83 ඡේදය පරිදි සේවක පාරිතෝෂික වෙන්කිරීම් සම්බන්ධයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා තීරණය කරන ලද වට්ටම් අනුපාතය වෙනුවට ඉකුත් වර්ෂයට අදාල වට්ටම් අනුපාතය පදනම් කරගෙන පොළී පිරිවැය ගණනය කිරීම හේතුවෙන් වර්ෂයේ පොළී පිරිවැය රු.1,070,732 කින් වැඩියෙන් සහ ආයුගණක ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20**

රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබී තිබුණු මුදලින් රත්නපුර පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැයකළ රු.357,964,043 ක මුදලක් ප්‍රාග්ධනිත කර තිබුණද වර්ෂයට අදාල ක්ෂය රු.21,850,722 ක් ගිණුම් ගතකර නොතිබුණි. තවද ඒ සම්බන්ධයෙන් ප්‍රමිතයේ 12 ඡේදය ප්‍රකාරව ක්ෂය වටිනාකමට සමාන ප්‍රමාණයක් රාජ්‍ය ප්‍රදානවලට අදාල විලම්භිත ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කරද නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

පූර්ව වර්ෂයන්හි සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගණනය කිරීමේ දී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් ඉකුත් වර්ෂ සඳහා අඩුවෙන් ගෙවූ දායක මුදල වූ රු.6,261,168 ක් සම්බන්ධයෙන් කාර්යාංශය අදාල අරමුදලට අභියාචනයක් ඉදිරිපත් කර තිබුණත් 2018 ඔක්තෝබර් 01 දින වන විටත් ඒ පිළිබඳ අවසන් නිගමනයකට එළඹ නොතිබුණි. ප්‍රමිතයේ 16 ඡේදය පරිදි අදාල බැරකම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

ප්‍රමිතයේ 63 ඡේදය ප්‍රකාරව කල් පිරෙන තෙක් රඳවා ගන්නා මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීමේ දී සඵල පොළී අනුපාතයට ( Effective Interest rate ) අනුව ගණනය කරන ලද පොළී ආදායම ආයෝජන ආදායම ලෙස හඳුනාගත යුතුව තිබුණි. එහෙත් කාර්යාංශය ප්‍රකාශිත පොළී අනුපාතය ( Coupon Interest Rate ) මත ගණනය කරන ලද පොලිය, ආයෝජන ආදායම ලෙස හඳුනා ගෙන තිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය බැංකුවක ආයෝජනය කළ රු.8,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතුව වෙනුවෙන් සෘජුව බැංකු ගිණුමට බැර වී තිබුණු රු.986,240 ක පොළී ආදායම හඳුනා ගැනීමෙන් තොරව විවිධ ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර ලැබිය යුතු පොළී ආදායම හා ආයෝජන යටතේ නැවත වරක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු පොළී ආදායම් රු.986,240 කින් සහ වර්ෂයේ විවිධ ආදායම් සමාන ප්‍රමාණයකින් වැඩියෙන් සටහන් වී තිබුණි.

### 2.3.3 පැහැදිලි නොකල වෙනස්කම්

ලෙජරයට අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය සහ අත්තිකාරම් ලේඛනය අනුව ශේෂය අතර රු.2,453,137 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**(අ) ලැබිය යුතු මුදල්**

(i) 2000 – 2012 කාලපරිච්ඡේදයට අදාලව ලැබිය යුතු රු.493,250 ක සෙස් කොමිස් මුදල සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) කාර්යාංශයට අයත් ගොඩනැගිල්ලක 2013 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන ඕමාන් තානාපති කාර්යාලය සඳහා 2017 දෙසැම්බර් 31 දිනට විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් කුලී ලෙස රු.67,568,640 ක් අයවිය යුතුව තිබුණි. එහෙත් එම කුලී මුදල 2018 අගෝස්තු 30 දින වන විටත් අය නොවී පැවතුණි.

(iii) අමාත්‍යාංශයේ පත්වීම් ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සිටි සංවර්ධන නිලධාරීන්ට 2017 වර්ෂයේ ජංගම දුරකථන බිල්පත් වෙනුවෙන් කාර්යාංශය විසින් ගෙවා තිබූ රු.11,055,416 ක් අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූර්ණය කළ යුතු බැවින් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණ ද රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 ජනවාරි 16 දිනැති ලිපිය මඟින් එම ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

**---------------------**

(i) කොරියානු බඳවා ගැනීමේ ගාස්තු ලෙස 2015 වර්ෂයේදී විගමණිකයන්ගෙන් අයකරගන්නා ලද රු.19,301,089 ක් හා විදේශ රැකියා නියෝජිත ආයතන ලියාපදිංචි ගාස්තුවෙන් 2015 හා 2016 වර්ෂවලට අදාලව නැවත ගෙවිය යුතුව තිබූ එකතුව රු.207,272,792 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිරවුල් කර නොතිබුණි.

(ii) තංගල්ල පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම වෙනුවෙන් තංගල්ල ප්‍රාදේශීය ලේකම් වෙත 2015 සිට 2017 දක්වා වූ කාලයට අදාලව කුලී ලෙස ගෙවිය යුතු රු. 34,720,000 ක් හා පෙර වර්ෂවලට අදාලව ආහාර සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතුව තිබුණු රු.1,419,703 ක් නිරවුල් කර නොතිබුණි.

**2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**-----------------------------------------------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 හි සඳහන් සීමාවන් ඉක්මවා 2012, 2014 හා 2015 වර්ෂවල අවස්ථා 4 කදී නිකුත් කරන ලද එකතුව රු.6,141,754 ක් වටිනා තත්කාර්යය අතුරු අග්‍රිම විගණිත දිනය වූ 2018 අගෝස්තු 15 දින වන විටත් පියවා නොතිබුණි.

**2.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**-------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි විධිවිධානවලට අනුව රැකියා සඳහා විදේශ ගතවන පුද්ගලයින්ගෙන් කාර්යාංශයේ මූලික ලියාපදිංචියක දී රු.15,200 ක් හා නැවත ලියාපදිංචියක දී රු.3,200 ක් පමණක් ගාස්තු වශයෙන් අයකල හැකිව තිබුණි. එහෙත් විධිමත් අනුමැතියකින් තොරව සහ ගාස්තු අයකිරීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැතිව විදේශගතවන ශ්‍රමිකයන්ගෙන් විවිධ ක්‍රම මඟින් ගාස්තු අය කර සමාලෝචිත වර්ෂයේ එකතුව රු.405,694,585 ක ආදායමක් උපයා ගෙන තිබුණි.

(ආ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 45 (1) වගන්තිය ප්‍රකාරව ලංකාවෙන් පිටත සේවයේ නියුක්ති ශ්‍රී ලාංකිකයන්ගේ යහපත පිණිස කම්කරුවන්ගේ සුභ සාධන අරමුදලක් පිහිටුවා පනතෙහි 45 (2) වගන්තියට අනුව ඒ සඳහා එකතුවන මුදල් එම අරමුදලට රැස්කළ යුතුය. එමෙන්ම කාර්යාංශ පනතේ 48 (ඇ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ ශ්‍රී ලාංකිකයන් පුහුණු කිරීම හා හුරු කිරීම සම්බන්ධයෙන් දරන ලද සියළු වියදම් එම අරමුදලෙන් දැරිය යුතුව තිබුණි. එහෙත් එම අරමුදලෙන් වියදම් දැරීමකින් තොරව කාර්යාංශය විසින් විදේශ ගතවන ශ්‍රමිකයන්ගෙන් වෙනමම පුහුණු ගාස්තු ලෙස එකතුව රු.143,272,642 ක් සමාලෝචිත වර්ෂයේ දී අයකර තිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ හි 9.7 වගන්තියට අනුව, භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව කාර්යාංශය විසින් සකස් කරගත් නිර්ණායක මත ක්‍රම 09 ක් යටතේ සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.83,174,556 ක කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ හා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.882,473,057 ක සහ රු.882,369,779 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.1,153,737,001 ක් සහ රු.1,151,728,485 ක ලාභයක් විය. ඒ අනුව සමූහයේ සහ කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.271,263,944 කින් හා රු.269,358,706 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ කොරියන් රැකියා සඳහා පිටත්වූ ශ්‍රමිකයන්ගෙන් අයකරන ගාස්තුවලින් වන ආදායම සියයට 50 කින් පමණ අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ දී රු.243,148,771 ක් වූ කාර්යාංශයේ බදු පසු ශුද්ධ ලාභය 2014 වර්ෂයේ දී වැඩි වී තිබුණද, 2015 වර්ෂයේ දී අඩු වී තිබුණි. එසේ වුවද, 2016 වර්ෂයේ සිට නැවත වැඩි වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් නැවත ගැලපීමේ දී 2013 වර්ෂයේදී රු.1,427,222,753 ක් වූ කාර්යාංශයේ දායකත්වය 2017 වර්ෂයේ දී රු.2,977,630,270 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---------------------------------------------

2016 වර්ෂයේ විදේශ රැකියා සඳහා පිටත්වී ඇති ශ්‍රමිකයින් සංඛ්‍යාව 242,930 ක් වූ අතර 2017 වර්ෂයේ එම සංඛ්‍යාව 212,162 ක් දක්වා, එනම් සියයට 12.66 කින් අඩුවී තිබුණි. කාර්යාංශයේ සංඛ්‍යාලේඛනවලට අනුව 2016 සහ 2017 යන වර්ෂ දෙකේදීම විදේශ රැකියා සඳහා පිටත් වූ කාන්තා සහ පිරිමි ශ්‍රමික සංයුතිය පිළිවෙලින් සියයට 34 ක් සහ සියයට 66 ක් විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශය විසින් 2015 වර්ෂයේ තෝරාගත් පෞද්ගලික ආයතනයක් සමඟ කුලී පදනම මත වාහන 09 ක් ලබාගැනීම සඳහා ඇතිකරගත් කුලී ගිවිසුම 2015 ඔක්තෝබර් 10 දිනට අවසන් වී තිබුණි. එහෙත් ආයතනය සතුව ඇති අබලන් වූ වාහන විකුණා අලුතින් වාහන මිලදී ගෙන නිලධාරීන්ගේ ප්‍රවාහන පහසුකම් සැපයීමට කටයුතු කරන බව දක්වමින් කුලී ගිවිසුම් කාලය අවස්ථා 06 කදී දීර්ඝ කරමින් නැවත ලංසු කැඳවීමකින් තොරව ඉහතකී ආයතනයෙන් දිගින් දිගටම වාහන ලබා ගැනීමට කටයුතු කර තිබුණි. 2017 වර්ෂයේ එසේ ලබාගත් වාහනවල කුලිය සියයට 10 කින් වැඩිකර තිබුණු අතර කුලී වාහන සංඛ්‍යාව 22 ක් දක්වා වැඩි කර ඒ සඳහා රු.26,879,520 ක් වැය කර තිබුණි.

කාර්යාංශය විසින් අබලන් තත්ත්වයේ පවතින බවට නිර්දේශ කර තිබූ වාහන 12 ක් 2018 වර්ෂයේ වෙන්දේසියට ඉදිරිපත්කර තිබුණු අතර එයින් 07 ක් විකුණා තිබුණි. එහෙත් කුලී වාහන වෙනුවට නව වාහන මිලදී ගැනීමට විගණිත දිනය වූ 2018 ජුනි 18 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශ සේවා නියුක්ති ක්ෂේත්‍රය තුල නීති ගරුක බව හා විනයානුකූල බව සහතික කිරීමේ අරමුණින් කාර්යාංශය විසින් විශේෂ විමර්ශන ඒකකයක් ආරම්භ කර 2017 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා 37 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි. 2017 වර්ෂයේ විවිධ කාරණාවලට අදාල පැමිණිලි 4,311 ක් කාර්යාංශයට ලැබී තිබුණද ඉන් පැමිණිලි 2,815 ක් එනම් සියයට 65 ක් විශේෂ විමර්ශන කටයුතු සඳහා යොමුකර තිබුණි.

කාර්යාංශයේ ක්‍රියාපටිපාටි අත්පොත අනුව විමර්ශන අංශයට එසේ ලැබෙන පැමිණිල්ලක් ලියාපදිංචි කර දින 14 ක් තුල විසඳුම් ලබා දීමට කටයුතු කල යුතු අතර එසේ කළ නොහැකි වූ පැමිණිලි සඳහා නීතිමය පියවර ගැනීමට නීති අංශයට යොමු කල යුතුව තිබුණි. එහෙත් 2017 වර්ෂය අවසන් වනවිට විසඳුම් ලබා දීමට හෝ නීති අංශයට යොමු කිරීමට නොහැකි වූ පැමිණිලි 345 ක් විමර්ශන අංශයේ තිබුණි.

(ඇ) 2017 වර්ෂයේ සහ ඊට පෙර වර්ෂ දෙකක විගණන නියැදි පරීක්ෂණයට භාජනය වූ මහජන පැමිණිලි 805 ක් අතුරින් පැමිණිලි 180 කට අදාල ආයතන අසාධු ලේඛනයට ඇතුළත් කර තිබුණද විභාග කිරීමෙන් තොරව මාසයක කාලයක් ඉක්මවා තිබුණු අතර පැමිණිලි 04 ක් වර්ෂයක කාලයක් ඉක්මවා තිබුණි. 2017 වර්ෂය තුල අසාධු ලේඛනගත වූ රැකියා නියෝජිත ආයතන අතුරින් ආයතන 02 ක් අවස්ථා 06 කදී සහ එක් ආයතනයක් අවස්ථා 07 කදී එසේ අසාධු ලේඛන ගත වී තිබුණි.

(ඈ) රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුව දරුවන්ගේ සුබ සිද්ධිය තකා මව්වරුන් විදේශගතවීම සීමා කිරීමේ අරමුණෙන් පවුල් පසුබිම් වාර්තා ලබා ගැනීමේ වැඩ පිළිවෙලක් රජය විසින් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ පිළිබඳව රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය විසින් සිදුකරන ලද පරීක්ෂණයකට අනුව, 2016 වර්ෂය තුල ව්‍යාජ ලෙස සකස් කරන ලද පවුල් පසුබිම් වාර්තා 6,420 ක් නිකුත් කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂාවකින් තොරව පවුල් පසුබිම් වාර්තා 60 ක් නිකුත් කිරීම, කූට ලේඛන සකස් කිරීම, අයථා ඉපයීම් සිදු කිරීම, එකම කාන්තාවකට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකින් පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම යන අක්‍රමිකතා සිදු වී ඇති බව හෙළිදරව් කර තිබුණි.

මෙම තත්ත්වය පාලනය කිරීමේ අරමුණෙන් පවුල් පසුබිම් වාර්තා අනුමත කිරීමට ප්‍රාදේශීය ලේකම් සභාපතිත්වය දරන කමිටුවක් පත්කර, ඊට අදාල අභියාචනා ඉදිරිපත් කිරීමට විශේෂ කමිටුවක්ද පත්කර තිබුණි. එහෙත් මෙම ක්‍රමවේදයට පටහැනිව 2017 වර්ෂයේ මාස 10 ක් ඇතුළත කාර්යාංශයේ ඉහළ කළමනාකරණය නියෝජනය කරන නිලධාරීන් 02 දෙනෙකු විසින් පවුල් පසුබිම් වාර්තා 100 ක් නිකුත් කර තිබුණි.

(ඉ) පසුගිය අනුගාමී වර්ෂ 03 තුල, රැකියා සඳහා විදේශගත වී විවිධ හේතූන් මත විදේශ දූත මණ්ඩලවල රැකවරණය සඳහා පැමිණි ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් 10,324 දෙනෙකු රැඳවුම් නිවාසවලට යොමුකර තිබුණි. 2017 වර්ෂය අවසන් වන විට එහි සිටි රැඳවියන් 250 දෙනෙකුගෙන් 20 දෙනෙකු මාස 06 කට වැඩි කාලයක් එම නිවාසවල ගත කර තිබුණි. එමෙන්ම එම නිවාසවල කුලී , කෑම සහ වෛද්‍යාධාර සඳහා 2017 වර්ෂය තුල එකතුව රු.43,300,824 ක් කාර්යාංශය විසින් වැය කර තිබුණි.

(ඊ) කාර්යාංශය විසින් 1988 වර්ෂයේ සිට ශ්‍රමිකයන් සඳහා විගමණික ශ්‍රමික දායක අරමුදල් ක්‍රමයක් පිහිටුවා තිබූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එම අරමුදලෙහි විගමණික ශ්‍රමිකයන් 1,602 දෙනෙකුට අයත් රු.7,708,918 ක ශේෂයක් පැවතුණි. මෙම අරමුදල

ආරම්භ කිරීමේ අරමුණු පැහැදිලි වන කිසිදු ලිඛිත තොරතුරක් කාර්යාංශය සතුව නොතිබුණු අතර අරමුදලෙහි කළමනාකාරීත්වය සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් නොමැතිව අරමුදල අකර්මන්‍ය තත්ත්වයට පත්ව තිබුණි.

මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට එහි සාමාජික දායකත්වය රු.7,708,918 ක වගකීමක් ලෙස දක්වා තිබුණද ඊට අයත් ආයෝජන සහ ලැබිය යුතු වටිනාකම්වල එකතුව රු.6,051,145 ක් පමණක් වී තිබුණි. එමෙන්ම මීට අදාල ගිණුම් වාර්තා නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් ආයෝජන ආදායම් නිවැරදිව අරමුදලට බැර වී තිබුණු බව තහවුරු නොවුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති රු.429,837,611 ක සේවක ණය ශේෂය තුල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ක්‍රියාත්මක වූ පහත සඳහන් ණය ක්‍රම පැවතුණි.

i. 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව නිලධාරියකුට ලබාදිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 කට සීමා විය යුතු වුවද ඊට පටහැනිව නිලධාරියෙකුගේ දළ වැටුප මෙන් 12 ගුණයක් ආපදා ණය ලබා දී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ණය ශේෂ ලැයිස්තුවට අනුව රු.250,000 ඉක්මවූ එකතුව රු.279,543,713 ක ණය ශේෂ 632 ක් ද, රු.500,000 ක් ඉක්මවූ ණය ශේෂ 149 ක් සහ රු.1,000,000 ක් ඉක්මවූ ණය ශේෂයක්ද පැවතුනි.

ii. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින්ද තොරව එක් නිළධාරියකුගේ මාසික වැටුපකට සීමාවන පරිදි ක්ෂණික ණය ලෙස ණය ලබාදීමේ ක්‍රමයක් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණ අතර ඊට අදාල එකතුව රු.1,305,975 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි.

(ඌ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ හා හදිසි අනතුරු වන්දි ලබාදීමේ රක්ෂණ ක්‍රමයක් 1995 වසරේ සිට ක්‍රියාත්මක කර තිබුණු අතර වාර්ෂිකව ඊට අදාල සම්පූර්ණ වන්දි මුදල් කාර්යාංශයේ ආදායම් උපයෝගී කරගෙන ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.45,088,783 ක මුදලක් ඒ සඳහා වැයකර තිබුණි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ II කොටසේ 17 වන වගන්තියේ 3 වන උප වගන්තියට අනුව කාර්යාංශ අරමුදල් මගින් මෙවැනි වියදම් දැරීමේ හැකියාවක් නොතිබුණි.

(එ) විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අබුඩාබි කාර්යාලයේ 2014 ජූනි මාසයේ සිදු වී තිබූ රු.1,058,276 ක මූල්‍ය අක්‍රමිකතාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට 2014 ජූනි 17 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් යොමු කර වර්ෂ තුනකට වැඩි කාලයක් ගත වී තිබුණ ද එහි ප්‍රගතියක් වාර්තා වී නොතිබුණ අතර මේ සම්බන්ධයෙන් කාර්යාංශය විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අලෙවිකරණ අංශයේ අරමුණු ඉටුකර ගැනීමේ උපායමාර්ගයක් ලෙස රැකියා සඳහා විදේශ ගතවීමට අපේක්ෂා කරන පුද්ගලයන්ගේ තොරතුරු ඇතුළත් රැකියා බැංකුවක් පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි. 2016 හා 2017 වර්ෂවල 17,663 දෙනෙකු එහි ලියාපදිංචි වී තිබුණු අතර රැකියා නියෝජිත ආයතන විසින් අවස්ථා 120,462 කදී එහි ලියාපදිංචි වුවන්ගේ තොරතුරු පරීක්ෂා කර තිබුණි. එහෙත් ලියාපදිංචි වුවන්ගෙන් 1,368 දෙනෙකුට පමණක් විදේශ රැකියා අවස්ථා හිමි වී තිබුණි.

2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ රැකියා බැංකුවේ ලියාපදිංචි වූ සංඛ්‍යාව 8,405 දෙනෙකුගෙන් (සියයට 182 කින්) ඉහළ ගොස් තිබුණි. එහෙත් 2016 වර්ෂයේ ලියාපදිංචි වූ සංඛ්‍යාවෙන් සියයට 09 ක් පමණ විදේශගත වී තිබුණු අතර 2017 වර්ෂය වන විට එය සියයට 07 ක් දක්වා පහත වැටී තිබුණි. අසාර්ථක වූ එම ක්‍රමවේදයට විකල්පයක් ලෙස විදේශ ශ්‍රම ඉල්ලුමට සරිලන පුහුණුවලත් අයදුම්කරුවන් අදාළ වෘත්තීය පුහුණු ආයතනවලින් තෝරාගෙන ලියාපදිංචි කර ගැනීම වැනි වැඩ පිළිවෙලක් පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සහ කාර්යාංශයේ සහයෝගිතාවයෙන් විගමණික සේවකයන් සඳහා ක්‍රියාත්මක වූ නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ, 2016 දෙසැම්බර් 31 දින වන විට විගමණිකයන් 10,264 දෙනෙකු සඳහා සමෘද්ධි බැංකුව මගින් රු.මිලියන 2,998 ක ණය මුදලක් ලබා දී තිබූ අතර ඉන් රු.මිලියන 360.27 ක් ණය ලබාදීමේ කොන්දේසිවලට පටහැනිව හා කිසිදු ඇපයක් තබා නොගෙන විගමණිකයන් 1,573 දෙනෙකු වෙත ලබා දී තිබුණි. තවද විගමණිකයින් 2,674 දෙනෙකු වෙත ලබා දී තිබූ රු.මිලියන 610.14 ක ණය ආපසු ගෙවීම පැහැර හැර තිබුණු අතර මේ වන විට එම යෝජනා ක්‍රමය අකර්මන්‍ය වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට යාවත්කාලීන කරන ලද තොරතුරු කාර්යාංශය සතු නොවූ අතර උක්ත කාර්යයට අදාලව කාර්යාංශය විසින් සමෘද්ධි අධිකාරිය නමින් ලංකා බැංකුවේ තැන්පත් කරන ලද රු.මිලියන 100 ක තැන්පතු මුදලට අදාල පොළියද 2014 වර්ෂයේ සිට කාර්යාංශයට ලැබී නොතිබුණි.

(ඇ) පවුල් පසුබිම් වාර්තා ලබා ගැනීම සඳහා කාර්යාංශය තුල ස්ථාපිත කර තිබූ පරිගණක පද්ධතිය නිර්මාණය කරන ලද කාර්යාංශයේ නිලධාරියකු වෙත විධිමත් අභ්‍යන්තර පාලනයකින් තොරව එම වාර්තා ලබා ගැනීම හා සම්බන්ධ කටයුතුද පවරා තිබුණි. ඔහු විසින් පවුල් පසුබිම් වාර්තා 09 ක් සඳහා පරිගණක පද්ධතිය හරහා ව්‍යාජ ලෙස නිර්දේශ ලබා දී තිබුණි. ඊට අදාල විශේෂඥ ආයතනයක් මගින් කරන ලද පරීක්ෂණයකට අනුව එම පද්ධතිය නිර්මාණයේදී සහ ක්‍රියාත්මක කිරීමේදී පැවති මූලික දෝෂයන් 05 ක් හඳුනාගෙන තිබුණු අතර එම තත්වය තුලින් ව්‍යාජ ලෙස පවුල් පසුබිම් වාර්තා නිකුත් කළ හැකි පරිසරයක් නිර්මාණය කර දී තිබුණු බව නිරීක්ෂණය විය.

ඊට විසඳුමක් ලෙස දැනට ක්‍රියාත්මක පරිගණක පද්ධතිය විධිමත් පරිදි හා වංචා හා වැරදි අවම වන පරිදි පවත්වා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ඉහත කී විශේෂඥ ආයතනය විසින් නිර්දේශ ලබා දී විගණිත දිනය වූ 2018 අප්‍රේල් 10 දින වන විට මාස 06 ක පමණ කාලයක් ඉක්ම ගොස් තිබුණද එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ලෙබනන්හි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කම්කරු සුබසාධන අංශයට තාවකාලික පදනමින් බඳවාගත් නිලධාරියකු විසින් එහි රාජකාරී කටයුතු වලට අදාලව ලැබී තිබූ ආදායම ඇ.ඩො.680 ක මුදලක් සහ සුළු මුදල් අග්‍රිමය ලෙස ලබා දුන් ඇ.ඩො. 400 ක මුදල පියවීමෙන් තොරව 2017 ජූලි 27 දින සිට සේවය හැර ගොස් තිබුණි. විධිමත් අධීක්ෂණයකින් සහ පාලනයකින් තොරව ආදායම් එක්රැස් කිරීම, ගිණුම්ගත කිරීම සහ වාර්තා තබා ගැනීම මෙන්ම සුළු මුදල් අග්‍රිමය පවත්වා ගැනීම වැනි රාජකාරී කටයුතු කිසිදු ඇප ආරක්ෂණයක් තබා ගැනීමකින් තොරව මෙලෙස තාවකාලික පදනම මත බඳවාගත් නිලධාරියකු වෙත පවරා තිබුණි. කෙසේ වුවද, සිදු වූ මූල්‍ය අලාභය එම පුද්ගලයාගෙන් අයකර ගැනීමට කාර්යාංශය කිසිදු උත්සාහයක් ගෙන නොතිබුණි.

## 4.4 අවිධිමත් ගනුදෙනු

කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම්වල නිලධාරීන් සඳහා නිල ඇඳුම් දීමනා ලෙස එක් අයකු වෙනුවෙන් වාර්ෂිකව රු.27,500 ත් රු. 28,000 ත් අතර මුදලක් බැගින් සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.10,423,267 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබුණි. එහෙත් එම නිලධාරීන්ට නිශ්චිත නිල ඇඳුමක් හඳුන්වා දී නොතිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුල කාර්යාංශයේ සේවක අර්ථසාධක අරමුදල් ගණනය කිරීමේ දී ජීවන වියදම් දීමනාව නොසලකා අර්ථසාධක මුදල් ගණනය කිරීම හේතුවෙන් වර්ෂ 10 ක් සඳහා එම අරමුදල වෙත කාර්යාංශයේ දායකත්වයට අමතරව සේවක දායකත්වය ලෙස එකතුව රු.42,859,186 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබීම නිසා මූල්‍යාමය පාඩුවක් සිදු වී තිබුණි.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් කාර්යාංශයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාරව ආයතනය සතු සම්පත් වෙනත් ආයතන වෙත මුදාහැරිය නොහැකි බව සඳහන්ව තිබුණද කාර්යාංශය විසින් 2017 වර්ෂය තුළ අවස්ථා කිහිපයක දී නිලධාරීන් 17 දෙනෙකු වෙනත් ආයතන වෙත සේවය සඳහා යොදවා තිබු අතර ඉන් 15 දෙනෙකු වෙනුවෙන් වැටුප් ලෙස ගෙවා තිබුණු රු. 5,762,530 ක මුදලද ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අනුමත කාර්ය මණ්ඩලය 1,251 න් මාණ්ඩලික ශ්‍රේණියේ සහ මාණ්ඩලික නොවන ශ්‍රේණිවල පිළිවෙලින් නිලධාරීන් 83 ක් හා 31 ක් පුරප්පාඩුව පැවතුනි. එහෙත් අනුමත සීමාව ඉක්මවා මාණ්ඩලික නොවන සේවා ගණයේ නිළධාරීන් 21 සහ ප්‍රාථමික සේවා ගණයේ සේවකයන් 28 දෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි.

(ආ) විදේශ දූත මණ්ඩල සුබසාධන අංශ සඳහා නිලධාරීන් පත් කිරීමට අදාලව කාර්යාංශය විසින් භාවිතා කරනු ලබන බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණු අතර දැනට භාවිතා කරන පරිපාටියෙහි රාජකාරී විස්තර, පත්වීමේ බලධාරියා, වැටුප් කේතය, වැටුප් පරිමාණය, සේවයට බඳවා ගැනීමේ ක්‍රමය, සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි යනාදී තොරතුරු ඇතුළත්ව නොතිබුණි.

ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් වශයෙන් පත් කිරීම සඳහා පුද්ගලයන් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු හා සුදුසුකම් සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 04/1607/027/027 මඟින් අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් විගණනයට ඉදිරිපත් කරන ලද බඳවා ගැනීමේ පටිපාටියෙහි දක්වා ඇති සුදුසුකම් හා එසේ අනුමත කරන ලද සුදුසුකම් අතර සැලකිය යුතු නොගැලපීම් නිරීක්ෂණය විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දින වන විට දූත මණ්ඩල 05 ක ප්‍රධානින් ලෙස පත්කරන ලද උපදේශකවරුන්ගේ පත්වීම් සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 50 ක් වුවද වයස අවුරුදු 53 ඉක්මවූ නිලධාරියෙකු සිංගප්පූරු දූත මණ්ඩලයේ උපදේශක ලෙස පත්කර තිබුණි.

(ii) උපදේශක තනතුර සඳහා සුදුසුකම් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ වසර 10 ක ජොෂ්ඨ විධායක තනතුරක සේවය සහිතව වසර 15 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු වුවත් කටාර් දූත මණ්ඩලයේ උපදේශක ලෙස පත් කළ නිලධාරියා එම සුදුසුකම් සපුරා නොතිබුණි.

(iii) සිංගප්පූරුව සහ ලෙබනන් යන දූත මණ්ඩලවලට බඳවා ගෙන තිබූ උපදේශකවරුන්ට අදාල අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් සපුරා තිබුණේද යන්න තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි පෞද්ගලික ලිපිගොනු තුල නොතිබුණි.

(ඈ) ජොෂ්ඨ කළමනාකරණ තනතුරට අභ්‍යන්තරිකව බඳවා ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කාර්යාංශයෙහි පළාත් කාර්යාල නවය සඳහා බඳවාගත් ජොෂ්ඨ කළමනාකරුවන් 09 දෙනා අතරට අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා නොමැති, නිලධාරීන් 03 දෙනෙකුද, බරපතල විෂමාචාර හේතුවෙන් අවස්ථා දෙකකදී විනය ක්‍රියාමාර්ගවලට යටත්ව දඩුවම් ලැබ තිබූ නිලධාරියෙකුද, ඇතුළත්ව තිබුණි.

(ii) 2012 අප්‍රේල් 03 දින M (IV) ශ්‍රේණියේ කළමනාකරණ තනතුරට පත් කර ඇති නිලධාරිනියක අනුමත බඳවා ගැනීමේ කාර්ය පරිපාටියට අනුව අන්තර්ග්‍රහණය කිරීමේ දී රු.31,310 ක වැටුප් පියවරේ පසු විය. එහෙත් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව මෙම වැටුප MM 1 – 1 (ii ශ්‍රේණිය) කළමනාකරණ තනතුරේ වැටුප් පියවර 9 විය. ඒ පිළිබඳ නොසලකා මෙම නිලධාරිනිය MM 1 – 1 (I ශ්‍රේණිය) කළමනාකරණ තනතුරට අන්තර්ග්‍රහණය කර තිබුණි.

(iii) මෙම නිලධාරීන්ට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්ව ඇති බවටත් නිලධාරීන් කිහිප දෙනෙකුගේ අධ්‍යාපන සහ අනෙකුත් වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික අදාල ආයතන මඟින් තහවුරු කරගත් බවට තොරතුරු පෞද්ගලික ලිපි ගොනු වල ඇතුලත් කර නොතිබුණි.

(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2016 ජුනි 30 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනමින් සම්බන්ධීකරණ නිලධාරීන් 10 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඊ) තවද, කළමනාකරණ තනතුරු 12 ක් හා සහකාර කළමනාකරු තනතුරු 19 ක් සඳහා සුදුසුකම්ලත් නිළධාරීන් ස්ථිරව බඳවාගැනීමෙන් තොරව වැඩ බැලීමේ පදනමින් පත්වීම් ප්‍රදානය කර තිබුණි. එසේ වැඩ බැලීමේ පත්වීම් ප්‍රදානය කර වර්ෂ 05 ක කාලයක් ඉක්ම වූ අවස්ථා 12 ක් නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

---------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

-----------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “ න්‍යාය පත්‍රය ” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
-----------------------------------------

6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට අදාල මූල්‍ය ප්‍රකාශන 2018 ජුනි 04 දින ඉදිරිපත් කර තිබුණි.

6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය
---------------------------------------

6.2.1 ප්‍රසම්පාදනයන්
------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශය විසින් එහි ශාඛා කාර්යාලයක් වෙනුවෙන් 2014 වර්ෂයේ කුලී පදනමින් ලබාගන්නා ලද ගොඩනැගිල්ලක් සඳහා සමාලෝචිත වර්ෂය නිම වන විට එකතුව රු.21,926,000 ක කුලියක් ගෙවා තිබුණි. ඊට අදාල විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

(i) ගොඩනැගිල්ල කුලියට ගැනීමට තීරණය කරන ලද 2014 ඔක්තෝබර් මස පළාත් තක්සේරුකරුගේ වාර්තාව අනුව මාසික තක්සේරු වටිනාකම රු.500,000 ක් හා වාර්ෂික කුලිය රු.5,660,000 ක් වුවද කාර්යාංශය විසින් රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත මාසික කුලිය රු.550,000 ක් දක්වා වැඩිකර 2015 පෙබරවාරි 13 දින වාර්ෂික කුලිය ලෙස රු.6,226,000 ක් ගෙවා එම ගොඩනැගිල්ල කුලියට ලබා ගෙන තිබුණි.

(ii) බදු ගිවිසුමට අනුව බදු කාලය ආරම්භක දිනය 2014 දෙසැම්බර් 01 දින වුවත් ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව 2014 දෙසැම්බර් 22 දින අමාත්‍යාංශ අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණේ 2014 නොවැම්බර් 20 දින දීය.

(iii) මෙම ප්‍රසම්පාදනයට අදාල පුවත්පත් දැන්වීමට අනුව වාහන 10 ක් නැවැත්වීමේ පහසුකම් තිබිය යුතු වුවත්, එම පරිශ්‍රය තුල වාහන තුනක් පමණක් නැවැත්වීමේ පහසුකම පවතින බව 2017 සැප්තැම්බර් 07 දින සිදුකරන ලද ස්ථානීය විගණන පරීක්ෂණයේදී අනාවරණය විය.

(iv) බදු කුලී ගිවිසුමට අනුව ගොඩනැගිලි හිමිකරු විසින් සිදුකළ යුතු වැඩවලට ඇතුළත් වායු සමීකරණ යන්ත්‍ර රඳවනයක් සඳහා රු.455,000 ක් හා නව ට්‍රාන්ස්පෝමරයක් සවි කිරීම සඳහා රු.2,105,758 ක් වශයෙන් එකතුව රු.2,560,758 ක් කාර්යාංශය විසින් වැය කර තිබුණි. කිසිදු පදනමකින් තොරව එම වියදම් සිදුකර මාස 05 කට සහ වර්ෂ 1 ½ කට පසුව වාරික වශයෙන් ගෙවීමට ගොඩනැගිලි හිමිකරුට අවස්ථාව සලසා දී තිබුණි. ඒ අනුව විගණිත දිනය වූ 2017 නොවැම්බර් මාසය වන විටත් ට්‍රාන්ස්පෝමරය වෙනුවෙන් වූ වියදමින් රු.852,892 ක් අයවී නොතිබුණි. එසේ වුවද කාර්යාංශය විසින් ගොඩනැගිලි වැඩිදියුණු කිරීමෙන් එහි තක්සේරු වටිනාකම වැඩි වූ බැවින් එතෙක් අයකරමින් පැවති මාසික කුලිය තවත් රු.200,000 කින් වැඩිකර මසකට රු.750,000 ක් බැගින් ගෙවීමට කළමනාකරණය කටයුතු කර තිබුණි.

(ආ) කාර්යාංශ නිලධාරීන් වෙත වාර්ෂික නිල ඇඳුම් ලබාදීමේ වැඩසටහන යටතේ කණිෂ්ඨ විධායක ශ්‍රේණියේ කාන්තා නිලධාරීන් 75 දෙනෙකු වෙනුවෙන් එකක් රු.4,250 බැගින් සාරි 450 ක් මිලට ගැනීම සඳහා රු.1,912,500 ක් හා මැහුම් කුලී ලෙස තවත් රු.432,000 ක් වැය කර තිබුණි. එහෙත් එම නිල ඇඳුම් භාවිතයට නුසුදුසු ඉතාමත් අඩු ගුණත්වයෙන් පවතින බවට අදාල නිලධාරීන් 42 දෙනෙකුගේ අත්සනින් යුතු ලිපියක් කාර්යාංශයේ සභාපති වෙත යොමු කර තිබුණි.

මීට අදාලව 2017 නොවැම්බර් 02 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවට අනුව නිලධාරීන්ගෙන් 29 දෙනෙකු නිල ඇඳුම් ඇඳ නොසිටි බව අනාවරණය විය. එහෙත් කාර්යාංශය විසින් මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

### 6.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

-----------------

2015 වර්ෂයේ අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකින් විගමණික සම්පත් මධ්‍යස්ථාන 08 ක් ඉදිකිරීමට හා 2018 වර්ෂය නිමවන විට ඉන් 06 ක වැඩ අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. එහෙත් විගණිත දිනය වූ 2018 ජූනි වන විට ඉන් 02 ක පමණක් වැඩ අවසන්කර තිබුණි. එකතුව රු.1,109,361 ක් වැය කරමින් තවත් මධ්‍යස්ථාන 04 ක් ඉදි කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර තිබුණද ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය සිදු නොකිරීම හේතුවෙන් තවදුරටත් ඉදිකිරීම් සිදුකළ නොහැකිව ඒ සඳහා වැය කළ මුදල නිෂ්කාර්ය වැයක් බවට පත්ව තිබුණි. එමෙන්ම මෙම කටයුත්ත ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසුව ආරම්භ කළ යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයේ වැඩිදුරටත් දක්වා තිබුණද එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) සුදුසුකම් සම්පූර්ණ නිලධාරීන් ස්ථිරව බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම සහ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු විධිමත් පරිදි පවත්වා ගෙන යාමට කටයුතු නොකිරීම.<br>(ii) කාර්ය මණ්ඩල දීමනා සහ ණය සම්බන්ධව ක්‍රියාපටිපාටි සකස් කර විධිමත් අනුමැතිය සහිතව ක්‍රියාත්මක නොකිරීම. |
| (ආ) | අභ්‍යන්තර පාලනය | වැරදි හා වංචා සිදු නොවීමට හා හෙළිදරව් වීමට හැකිවන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කර පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ණය ගැති හා ණය හිමි පාලනය | කාර්යාංශය සතු දිගුකාලීන ණයහිමි සහ ණයගැති ශේෂ නිරවුල් නොකිරීම සහ නියමිත කාලය තුල ණයහිමි සහ ණයගැති ශේෂ පියවන ආකාරයේ පාලන ක්‍රම ස්ථාපිත කර නොතිබීම. |